# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2144/59 - 2019 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2019.10.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුවන්කේනි 02 (198ඒ) ග්‍රාම සේවා වසමේ කලුවන්කේනි ගම්මානේ පිහිටා ඇති හා මිනින්දෝරු අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් සකස්කරන ලද "පීපී/මඩ/2936" අංකය දරන මූල ප්‍රස්ථාරයේ දක්වන ලද හෙක්ටයාර් 4.1805 ක ප්‍රමාණයෙන් යුතු පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කලුවන්කේනි භූමි; හිමිකම්පාන්නා: මාර්කස් කුරු; ප්‍රමාණය: හෙක්ටයාර් 4.1805.

*මායිම්* :-

උතුරට: කලුවන්කේනි භූමි, වෙම්පුක්කාඩු, පීපී මඩ 810හි කැබලි අංක 11, ටීපී 354278, පීපී මඩ 5041හි කැබලි අංක 83, ටීපී 324449, ටීපී 324774 හා ටීපී 324415; නැගෙනහිරට: ටීපී 354278, පීපී 5041හි කැබලි අංක 83, ටීපී 324449, ටීපී 324774, ටීපී 324415, පීපී 4761හි කැබලි අංක 3086 හා පීපී 5041 හි කැබලි අංක 93; දකුණට: පීපී 4761 හි කැබලි අංක 3086, ටීපී 203826, කලුවන්කේනි භූමි හා පීපී 2713හි කැබලි අංක 77786; බටහිරට: ටීපී 203826, පීපී 2712හි කැබලි අංක 77786, කලුවන්කේනි භූමි, පී පී මඩ 810 හි කැබලි අංක 11 හා වෙම්පුක්කාඩු.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 දෙසැම්බර් මස 09 වැනි දින පෙ. ව. 10.00ට ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2019 නොවැම්බර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඒරාවූර් පත්තුව ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එන්. විල්වරත්නම්,
ප්‍රාදේශීය ලේකම්,
එරාවූර් පත්තු.

වෙන්කලඩි,
එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-928



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: ම/සං/03/230.

වර්ෂ 2018ක් වූ ඔක්තෝබර් මස 22 වැනි දින අංක 2094/1 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංක ගම් 4106 දරන පිඹුරේ කැබලි අංක 28, කැබලි අංක 130 සහ 131 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

01. **කැබලි අංක 130**
ඉඩමේ නම: —; විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: එම්. ඉරේෂා කුමුදුනී ප්‍රනාන්දු, අංක 496/2 මුදලිගේ මාවත, ඉහල කරගමුණ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0032.

02. **කැබලි අංක 131**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල්හිමිකම් කියන අය: එම්. ඉරේෂා කුමුදුනී ප්‍රනාන්දු, අංක 496/2 මුදලිගේ මාවත, ඉහල කරගමුණ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0215.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ (කැබලි අංක 130 සහ 131 දක්වා) 2019 ඔක්තෝබර් මස 28 වැනි දින පෙ. ව. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019 ඔක්තෝබර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2019 ඔක්තෝබර් මස 09 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-938

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.